**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**තෙවන වාර පරීක්ෂණය 2020** — **11 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2020** — **தரம் 11**
**Third Term Test 2020** — **Grade 11**

**පුරවැසි අධ්‍යාපනය II**
**குடியியற் கல்வி II**
**Civic Education II**

**පැය දෙකයි**
**இரண்டு மணித்தியாலம்**
***Two hours***

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

---

01) i) ඒකීය ආණ්ඩුක්‍රම පවතින රටවල් දෙකක් නම් කරන්න.

ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම නිසා ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

iii) රාජ්‍යයකට පැවරෙන කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

iv) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග දෙකක් නම් කරන්න.

v) ස්විට්සර්ලන්ත ව්‍යවස්ථාදායකයේ ආයතන දෙක නම් කරන්න.

vi) භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම දෙක නම් කරන්න.

vii) පරිවර්තන ආර්ථිකයන්හි මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

viii) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියා මාර්ග දෙකක් සඳහන් කරන්න.

ix) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය (පාර්ලිමේන්තුව) සතු බලතල හා කාර්ය දෙකක් සඳහන් කරන්න.

x) ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝග ජය ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

(ල. 2 × 10)

02) i) වර්තමාන රාජ්‍යය තුළ ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීම අපහසු වීමට බලපාන හේතු දෙකක් ලියන්න. (ල. 02)

ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටුවිය යුතු කාර්යයන් තුනක් ලියන්න. (ල. 03)

iii) a) ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු සතුවිය යුතු වැදගත් ගුණාංග තුනක් සඳහන් කරන්න. (ල. 03)

b) ඉන් එකක වැදගත්කම පැහැදිලි කරන්න. (ල. 02)

03) i) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක දෙකක් ලියන්න. (ල. 02)

ii) යහපාලනයක මූලික ගුණාංග තුනක් ලියන්න. (ල. 03)

iii) a) බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක කිරීමෙන් උදාකර ගත හැකි ප්‍රතිඵල තුනක් සඳහන් කරන්න. (ල. 03)

b) ඉන් එකක වැදගත්කම විස්තර කරන්න. (ල. 02)

04) i) ගැටුමක් ඇති වීමට බලපාන හේතු දෙකක් ලියන්න. (ල. 02)

ii) ගැටුම් නිරාකරණය සඳහා මැදිහත්කරණය යොදා ගත හැකි අවස්ථා තුනක් සඳහන් කරන්න. (ල. 03)

iii) a) ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීමෙන් ඇතිවන වාසි සහගත තත්වයන් තුනක් සඳහන් කරන්න. (ල. 03)

b) ඉන් එකක වැදගත්කම පැහැදිලි කරන්න. (ල. 02)

05) i) නීතියේ මූලාශ්‍ර දෙකක් ලියන්න. (ල. 02)

ii) අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීම සිදු නොවීම නිසා ඇතිවිය හැකි ප්‍රතිඵල තුනක් සඳහන් කරන්න. (ල. 03)

iii) a) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න. (ල. 03)

b) ඉන් එකක් විස්තර කරන්න. (ල. 02)

06) i) පරිසරයෙන් මිනිසාට ලැබෙන සේවා දෙකක් ලියන්න. (ල. 02)

ii) ජෛව පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන ප්‍රතිඵල තුනක් සඳහන් කරන්න. (ල. 03)

iii) a) තිරසාර සංවර්ධනය සඳහා පුරවැසි යුතුකම් තුනක් සඳහන් කරන්න. (ල. 03)

b) ඉන් එකක වැදගත්කම පහදන්න. (ල. 02)

07) i) ජාත්‍යන්තර සබඳතාවල ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න. (ල. 02)

ii) විදේශ වෙළඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන තුනක් නම් කරන්න. (ල. 03)

iii) a) ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීමෙහි ලා බලපෑ සාධක තුනක් සඳහන් කරන්න. (ල. 03)

b) ඉන් එකක් විස්තර කරන්න. (ල. 02)